# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2182/10 - 2020 ජුනි මස 30 වැනි අඟහරුවාදා - 2020.06.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත**

1985 අංක 48 දරන සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4 වන වගන්තියේ (3) වන උප වගන්තිය සහ 14 වන වගන්තිය සමඟ කියවිය යුතු, 20 වන වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් සාදනු ලබන රෙගුලාසි.

මහින්ද රාජපක්ෂ,
මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍ය.

2020 ජුනි මස 30 වැනි දින,
කොළඹ 01,
මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශයේ දී ය.

රෙගුලාසි

1. මෙම රෙගුලාසි 2020 අංක 03 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. මෙම රෙගුලාසිවලින් කියවෙන සංශෝධනයන් බලපැවැත්වෙනුයේ 2020 ජුනි 30 දින හෝ ඊට පසු දිනයක තොටුපොළෙන් පැටවුම් කරනු ලබන ආනයනික භාණ්ඩ සඳහා පමණක් වන අතර රෙගුලාසි 8(ඇ) බලපැවැත්වෙනුයේ එහි සඳහන් කාල සීමාව මත පැටවුම් කරනු ලබන භාණ්ඩ සඳහා වේ.

3. 2020 මැයි මස 22 දිනැති අංක 2176/19 දරන *අතිවිශේෂ ගැසට් පත්‍රය* මගින් ප්‍රකාශයට පත් කරන ලද රෙගුලාසි අංක 4, 5,6, 8, 9, 10 සහ 18 පරිච්ඡින්න කර, පහත රෙගුලාසි ආදේශ කරනු ලැබේ.

1A PG 5047 - 617 (2020/07)

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www. documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

4. අ) සෘජු අපනයනය සඳහා හෝ වෙනත් අපනයනකරුවෙකුට සැපයීම සඳහා I සහ II උපලේඛනවල භාණ්ඩ ද ඇතුළත්ව ඕනෑම භාණ්ඩයක් ආනයනය කරන, අපනයන සැකසුම් සඳහා තාවකාලික ආනයන කිරීමේ ක්‍රමය (ටී.අයි.ඊ.පී.) යටතේ ලියාපදිංචි හෝ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල් හෝ අපනයනය සංවර්ධන මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල් නිර්දේශ කරනු ලබන ආනයනකරුවකු විසින්, කාර්තුවක් තුළ අපනයනය කරන ලද භාණ්ඩවල මුළු වටිනාකම සහ දේශීය බැංකුව විසින් සහතික කළ අපනයන සඳහා ලැබෙන විදේශ ප්‍රේෂණයන්, පහත පරිදි ප්‍රකාශයට පත් කළ යුතුය ;

i. කාර්තුව ආරම්භයේ දී ලැබෙන ප්‍රේෂණ
ii. කාර්තුව තුළ සිදුකරනු ලබන අපනයනවල වටිනාකම
iii. කාර්තුව තුළ ලද ප්‍රේෂණ
iv. කාර්තුව අවසානයේ ලැබෙන ප්‍රේෂණ

එම මුදල් ලැබුණු බව අදාළ බැංකුව විසින් තහවුරු කරන ලද සහතිකයක් සමගින් ඉහත සඳහන් දත්ත සෑම කාර්තුවකදීම රේගු අධ්‍යක්ෂ ජනරාල් සහ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල් හෝ අපනයනය සංවර්ධන මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කළ යුතුය.

ආ) තවද, වෙනත් අපනයනකරුවෙකුට සැකසීම සඳහා භාණ්ඩ ආනයනය කර සපයන ආනයනකරුවකු (වක්‍ර අපනයනකරු), ඉහත දත්ත වලට අමතරව, මිලදී ගැනීමේ නියෝගය බැංකු සහ රේගු අධ්‍යක්ෂ ජනරාල් වෙත, පිළිවෙලින් නිෂ්කාශනය කිරීමේ කටයුතු සඳහා ලේඛන නිකුත් කිරීම සහ ශ්‍රී ලංකා රේගුවෙන් භාණ්ඩ නිදහස් කිරීම යන කරුණු සඳහා ඉදිරිපත් කළ යුතුය.

එවැනි අවස්ථාවලදී බැංකු විසින්,

i. පෙර ගෙවීමක් සිදු කිරීමේදී හෝ ණයවර ලිපියක් විවෘත කිරීමේදී හෝ ණයවර ලිපියක් යටතේ ණය පහසුකම් නොමැතිව ගෙවීමක් සිදු කිරීමේදී (එල්.සී ඇට් සයිට්) හෝ ගෙවීම් මත ලේඛන (ඩී.පී.) යටතේ ගෙවීමක් සිදු කිරීමේදී නම්, අපනයනකරු විසින් වක්‍ර අපනයනකරුට නිකුත් කරනු ලබන මිලදී ගැනීමේ ඇණවුම ද

ii. පිළිගැන්ම මත ලේඛන (ඩී.ඒ.) හෝ විවෘත ගිණුම් (ඕ.ඒ.) හෝ ණයවර ලිපියක් යටතේ ණය පහසුකම් සහිතව (යුසන්ස් එල්.සී) යන ගෙවීම් ක්‍රම යටතේ ගෙවීම් සිදුකරන විට දී නම්, අපනයනකරු විසින් වක්‍ර අපනයනකරුට නිකුත් කරනු ලබන භාණ්ඩ භාර ගැනීමේ සටහන ද

සලකා බැලිය යුතුය.

ඉහත 4(ආ)(i)සඳහන් අවස්ථාවක දී, වෙනත් අපනයනකරුවකුට සැකසීම සඳහා භාණ්ඩ ආනයනය කර සපයන ආනයනකරු (වක්‍ර අපනයනකරු), රේගු නිෂ්කාශනය කළ දින සිට දින 14 ක් ඇතුළත භාණ්ඩ භාර ගැනීමේ සටහන (ජී.ආර්.එන්.) ශ්‍රී ලංකා රේගුවට ඉදිරිපත් කළ යුතුය. නියමිත කාල සීමාව තුළ එවැනි ආනයනකරුවෙකු (වක්‍ර අපනයනකරු) එවැනි සටහනක් (ජී.ආර්.එන්.) ඉදිරිපත් කිරීමට අපොහොසත් වුවහොත්, ශ්‍රී ලංකා රේගුව විසින් ආනයන හා අපනයන පාලක ජනරාල්වරයාට දැන්විය යුතු වන අතර එම ආනයනකරු (වක්‍ර අපනයනකරු) ඉන්පසු ඕනෑම අපනයනකරුවෙකුට සැකසීම සඳහා භාණ්ඩ ආනයනය කර සැපයීමට නුසුදුස්සකු වනු ඇත.

ඇ) මෙම රෙගුලාසිය ක්‍රියාත්මක කිරීම සඳහා,

i. ආනයනකරු විසින් 2020 ජූලි මස ආරම්භයේදී සිය පළමු විදේශ විනිමය ලැබීමේ ප්‍රකාශය ද, පළමු කාර්තු ප්‍රකාශය 2020 සැප්තැම්බර් මස අවසානයේදී ද ඉදිරිපත් කළ යුතු අතර ඉන් පසුව එය කාර්තුමය පදනමක් මත ඉදිරිපත් කිරීම

සහ

ii. අවම වශයෙන් 20% දේශීය අගය එකතු කිරීමකට යටත්ව ප්‍රති-අපනයන කිරීමේ අරමුණින් ආනයනය කිරීම සිදු කළ යුතුය.

iii. සෑම අවස්ථාවකදීම රෙගුලාසි අංක 4, 5 සහ 6 හි සඳහන් ආනයනකරු, රෙගුලාසි අංක 5 සහ 6 හි සඳහන් කර ඇති ආනයනික භාණ්ඩ භාවිතකොට සකසන ලද භාණ්ඩ අපනයනය කරන ලද දින සිට දින 120ක් නොඉක්මවන දිනයකදී විදේශ විනිමය ඉපයුම් ශ්‍රී ලංකාවේ බැංකුවකට ගෙන්වාගත යුතුය.

5. අපනයන සැකසුම් කිරීම අරමුණු කරගත් රෙගුලාසි 4 හි සඳහන් ආනයනකරුවෙකුට I සහ II වන උපලේඛනවල ඇති අයිතම ද ඇතුළුව ඕනෑම භාණ්ඩයක් 2012 ජනවාරි මස 02 දිනැති අංක 1739/3 දරන *අතිවිශේෂ ගැසට් පත්‍රයේ* දක්වා ඇති රෙගුලාසි 3(1)අ, 3(1)ආ සහ 3(1)ඇ යන ගෙවීම් ක්‍රම යටතේ ආනයනය කළ හැකිය.

6. අ) පහත සඳහන් අවස්ථා වලදී අපනයනය සැකසුම් සඳහා අවශ්‍ය ඕනෑම භාණ්ඩයක් ආනයනය කරන විට ඉහත 4(ඇ)(iii)හැර 4 රෙගුලාසියෙහි සඳහන් සීමා කිරීම්වලට යටත් නොවේ. තවද මෙම රෙගුලාසිය ක්‍රියාත්මක කිරීමේ දී ආනයනයන් සඳහා මුදල් සපයාගත් මූලාශ්‍රය ආනයනකරු විසින් වාණිජ බැංකුව වෙත හෙළිදරව් කළ යුතුය.

i. විදේශ විනිමය වැය නොවන පදනම මත ආනයනය කරන විට දී,

ii. දේශීය බැංකුවලින් ආනයනය සඳහා මුදල් නොගෙන විදේශ ගැනුම් කරුවන්ගේ මුදල් භාවිත කර ආනයනය කරන විට දී.

iii. අපනයනකරුවන් විසින් අපනයනය කිරීමෙන් උපයාගත් විදේශ විනිමය තැන්පත් කර ඇති බැංකු ගිණුම්වල (එෆ්.සී.බී.යූ සහ බී.එෆ්.සී.ඒ) ධන ශේෂය නොඉක්මවන සේ එම ගිණුමේ මුදල් භාවිතා කොට අපනයනය සඳහා ආනයනය කරන විට දී.

ආ) ඉහත 6(අ)(i) සහ 6(අ)(ii) රෙගුලාසි යටතේ භාණ්ඩ ආනයනය කරන විටදී, එම රෙගුලාසියෙහි සඳහන් අවස්ථාවලට අදාළව ආනයනය කරන බවට වූ ප්‍රකාශනයක් ශ්‍රී ලංකා රේගුවට ඉදිරිපත් කර භාණ්ඩ නිදහස් කළ හැකි අතර ඒ සඳහා වෙනත් ආයතනයක අනුමැතියක් අවශ්‍ය නොවේ.

8. අ) දේශිය වෙළඳපොළ අවශ්‍යතා ඉලක්ක කර භාණ්ඩ නැව්ගත කරණු ලබන රටෙන් 2020 මැයි 22 දින සිට නැව්ගත හෝ ගුවන්ගත කරනු ලබන I උපලේඛනයේ සඳහන් අයිතම(ය), 2012 ජනවාරි මස 02 දිනැති අංක 1739/3 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ දක්වා ඇති රෙගුලාසි 3(1)අ, 3(1)ආ, 3(1)ඇ යන ගෙවීම් ක්‍රම යටතේ, නැවත දැනුම්දෙන තුරු ආනයනය තාවකාලිකව අත්හිටුවන ලදි.

ආ) එසේවුවද, දේශීයව එකතු කළ අගය 35%ක හෝ ඊට වැඩි අයිතම නිෂ්පාදනය කරන අවස්ථාවල දී සහ දේශීයව අමුද්‍රව්‍ය සපයාගත නොහැකි අවස්ථාවන්වල දී I උපලේඛනයේ දක්වා ඇති අයිතම(ය) විදේශීය සැපයුම්කරුගෙන් අවමය දින 30ක ණය පහසුකම මත පමණක් ආනයනය සිදු කිරීමට ඉඩදෙනු ලැබේ. ශ්‍රී ලංකා රේගුව විසින් අදාළ අමාත්‍යංශ/ රාජ්‍ය ආයතන සම්බන්ධ කර ගනිමින් එකී ආනයන ආදේශක කර්මාන්තවල අගය එකතු කිරීම පිළිබඳව ගණනය කර මාසික වාර්තාවක් මුදල් අමාත්‍යංශය හරහා අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කළ යුතුය.

ඇ) දේශීය වෙළෙඳපොල ඉලක්ක කොටගෙන,සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ 07.02, 07.03, 07.05, 07.06, 07.07, 07.08, 07.09, 07.13, 07.14, 08.01, 08.03, 08.04, 08.07, 08.10, 08.11, 10.06, 10.07, 10.08, 11.02, 11.03, 11.06, 12.02, 12.07, 12.08 යටතේ I වන උපලේඛනයේ සඳහන් සංයෝජිත වර්ගීකරණ සංකේතාංක අදාළ කෘෂිකාර්මික නිෂ්පාදන සඳහා 80% ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක පෙර ගෙවීමක් 2020 මැයි මස 21 හෝ ඊදිනට පෙර සිදු කර ආනයනය කර ඇත්නම් එම අයිතම ශ්‍රී ලංකා රේගුවෙන් නිෂ්කාශනය කළ හැකිය.

ඇ) දේශීය වෙළෙඳපොල ඉලක්ක කොටගෙන 2020 මැයි මස 21 දිනට පෙර නැව්ගත හෝ ගුවන්ගත කරනු ලබන, 2020 අප්‍රේල් මස 16 දිනැති අංක 2171/5 දරන *අතිවිශේෂ ගැසට් පත්‍රයේ* I වන උපලේඛනයේ සඳහන් අයිතම සඳහා 20% ක් හෝ ඊට වැඩි පෙර ගෙවීමක් 2020 අප්‍රේල් මස 17 හෝ ඊදිනට පෙර සිදු කර ආනයනය කර ඇත්නම් එම අයිතම විදේශීය සැපයුම්කරුගෙන් අවමය දින 90ක ණය පහසුකම මත පමණක් ශ්‍රී ලංකා රේගුවෙන් නිෂ්කාශනය කළ හැකිය.

9. අ) දේශීය වෙළෙඳපොල අවශ්‍යතා ඉලක්ක කර භාණ්ඩ නැව්ගත කරනු ලබන රටෙන් 2020 මැයි මස 22 දින සිට නැව්ගත හෝ ගුවන්ගත කරනු ලබන, II වන උපලේඛනයේ දක්වා ඇති වාහන අමතර කොටස්, තොරතුරු තාක්ෂණ උපකරණ, සන්නිවේදන උපකරණ, සිමෙන්ති, සීනි, සහ පාම් තෙල් හැර අනෙකුත් අයිතම(ය)නැවත දැනුම්දෙන තුරු ආනයනය සිදුකළ හැක්කේ භාණ්ඩ පැටවුම් දිනයේ සිට විදේශීය සැපයුම්කරුගෙන් ලබාගන්නා අවමය දින 90ක වූ ණය පහසුකම හෝ විදේශ මුදල් වලින් දේශීය බැංකුවල පවත්වාගෙන යනු ලබන ආනයනය සඳහා වූ බැංකු තැන්පතු මත පමණි.

ආ) II වන උපලේඛනයේ දක්වා ඇති වාහන අමතර කොටස් (87.08, 87.14 යන සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ යටතේ එන සියලු අයිතම), තොරතුරු තාක්ෂණ උපකරණ (85.19, 85.21, 85.22, 85.23, 85.40 යන සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ යටතේ එන සියලු අයිතම) සන්නිවේදන උපකරණ (85.17, 85.18, 85.25, 85.26, 85.27, 85.29 යන සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ යටතේ එන සියලු අයිතම) සිමෙන්ති (25.23 යන සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ යටතේ එන සියලු

අයිතම), සීනි (17.01 යන සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ යටතේ එන සියලු අයිතම) සහ පාම් තෙල් (15.11 යන සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ යටතේ එන සියලු අයිතම), ආනයනය සිදුකළ හැක්කේ භාණ්ඩ පැටවුම් දිනයේ සිට විදේශීය සැපයුම්කරුගෙන් අවමය දින 180ක වූ ණය පහසුකම හෝ විදේශ මුදල් වලින් දේශීය බැංකුවල පවත්වාගෙන යනු ලබන ආනයනය සඳහා වූ බැංකු තැන්පතු මත පමණි.

ඇ) දේශීය වෙළෙඳපොළ ඉලක්ක කොටගෙන II වන උපලේඛනයේ සඳහන් අයිතම ආනයනය කිරීම සඳහා 80% ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක පෙර ගෙවීමක් 2020 මැයි මස 21 හෝ එදිනට පෙර සිදු කර ආනයනය කර ඇත්නම් ඉහත 9(අ)සහ 9(ආ) හි සඳහන් සීමා කිරීම් බලනොපැවැත්වේ.

ඈ) ඉහත රෙගුලාසි 9(අ) සහ 9(ආ) හි කෙසේ සඳහන් වුවද, දේශීයව එකතු කළ අගය 35%ක හෝ ඊට වැඩි අයිතම නිෂ්පාදනය කරන අවස්ථාවල දී සහ දේශීයව අමුද්‍රව්‍ය සපයාගත නොහැකි අවස්ථාවන්වල දී II උපලේඛනයේ දක්වා ඇති අයිතම විදේශීය සැපයුම්කරුගෙන් අවමය දින 30ක ණය පහසුකම මත පමණක් ආනයනය සිදු කළ හැක. ශ්‍රී ලංකා රේගුව විසින් අදාළ අමාත්‍යාංශ/ රාජ්‍ය ආයතන සම්බන්ධ කර ගනිමින් එකී ආනයන ආදේශක කර්මාන්තවල අගය එකතු කිරීම පිළිබඳව ගණනය කර මාසික වාර්තාවක් මුදල් අමාත්‍යාංශය හරහා අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කළ යුතුය.

10. අ) 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනතේ 17 වැනි වගන්තිය යටතේ අනුමත කරන ලද ප්‍රධාන ව්‍යාපෘති සඳහා අවශ්‍යවන, මුදල් අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද නිශේධන ලැයිස්තුවේ (Negative List) නොමැති, I උපලේඛනයේ දක්වා ඇති අයිතම(ය) ආයෝජකයන්ගේ සෘජු විදේශ මුදල් ආයෝජන යටතේ ආනයනය කළ හැක. තව ද, දේශීය බැංකුවලින් ලබා ගන්නා ණය, ආනයනය සඳහා යොදා ගැනීමෙන් වැළකිය යුතුය.

ආ) මෙයට පටහැනිව ඉහත 8 රෙගුලාසියේ කුමක් සඳහන් වුවද, දේශීය වෙළඳපොළ ඉලක්ක කර ගත් සෘජු විදෙස් ආයෝජන නොමැති 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනතේ 17 වැනි වගන්තිය යටතේ අනුමත කරන ලද ව්‍යාපෘති සඳහා මුදල් අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද නිශේධන ලැයිස්තුවේ නොමැති I උපලේඛනයේ දක්වා ඇති අයිතම(ය) විදේශීය සැපයුම්කරුගෙන් දින 90 ක ණය පහසුකම මත පමණක් ආනයනය සිදු කළ හැක.

ඇ) එසේ වුවද, සැපයුම්කරුවන්ගෙන් ණය පහසුකම් ලබා ගත නොහැකි, 2020 ඔක්තෝබර් මස 31 දිනට පෙර වාණිජ මෙහෙයුම් ආරම්භ කිරීමට බලාපොරොත්තු වන, 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පණතේ, 17 වන වගන්තිය යටතේ අනුමත කරන ලද ව්‍යාපෘති සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමඟ එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවනු ලබන පාර්ශවය විසින් එළඹුන ගිවිසුම ප්‍රකාරව, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලීය අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියට යටත්ව, I උපලේඛනයේ දක්වා ඇති අයිතම(ය) ආනයනය කළ හැක.

18. මෙම රෙගුලාසි වල,

i. '**ආනයනය තාවකාලිකව අත්හිටුවීම**' යන්නෙන් අදහස් කරනුයේ ඉහත රෙගුලාසිවලට අනුකූලනොවන පරිදි භාණ්ඩ ආනයන කිරීම තහනම්වන බව ය.

ii. '**අපනයනය**' යන්නෙන් අදහස් කරන්නේ, 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 22 වන වගන්තියේ සඳහන් පරිදි ඕනෑම භාණ්ඩයක් සම්බන්ධයෙන් වන විට, මුහුදෙන් හෝ ගුවන් මගින් ශ්‍රී ලංකාවෙන් රැගෙන යාම සහ පිටතට ගෙනයාම හෝ ශ්‍රී ලංකාවෙන් රැගෙන යාමට හෝ පිටතට ගෙන යාමට සිදු වීම.

iii. '**ආනයනය**' යන්නෙන් අදහස් කරන්නේ, 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 22 වන වගන්තියේ සඳහන් පරිදි ඕනෑම භාණ්ඩයක් සම්බන්ධයෙන් වන විට, මුහුදෙන් හෝ ගුවන් මගින් ශ්‍රී ලංකාවට ආනයනය කිරීම හෝ රැගෙන ඒම හෝ ශ්‍රී ලංකාවට ආනයනය කිරීමට හෝ රැගෙන ඒමට සිදු වීම.

iv. '**ආනයනකරු (වක්‍ර අපනයනකරු)**' යන්නෙන් අදහස් කරන්නේ වෙනත් අපනයනකරුවෙකුට සැකසීම සඳහා භාණ්ඩ ආනයනය කර සැපයීමට, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ හෝ අපනයන සංවර්ධන මණ්ඩලයේ නිර්දේශය අවශ්‍යවන පුද්ගලයෙකු හෝ අපනයන සැකසුම් සඳහා තාවකාලික ආනයන කිරීමේ ක්‍රමය (ටී.අයි.ඊ.පී.) යටතේ ලියාපදිංචි පුද්ගලයෙකි.

v. '**දේශීයව එකතු කළ අගය**' යන්නෙන් අදහස් වන්නේ ආනයනික භාණ්ඩ ඒකකයක අගය කර්මාන්තශාලාවේදී ඉහළ නංවනු ලබන ප්‍රමාණය වන අතර එය පහත සමීකරණය අනුව ගණනය කෙරේ.

$$\text{දේශීයව එකතු කළ අගය} = \frac{\text{කර්මාන්තශාලාවෙන් පිටතට එන විටදී භාණ්ඩවල මිල (තොග මිල)} - \text{ආනයනය කරන ලද අමුද්‍රව්‍ය වල මිල, රක්ෂණ සහ ගැල් කුලී (මි.ර.ගැ.)වටිනාකම}}{\text{කර්මාන්තශාලාවෙන් පිටතට එන විටදී භාණ්ඩවල මිල (තොග මිල)}} \times 100\%$$

vi. '**විදේශ විනිමය වැය නොවන පදනම**' යන්නෙන් අදහස් කරන්නේ ශ්‍රී ලංකාවෙන් පිටතට විදේශ විනිමය ගෙවීමකින් තොරව භාණ්ඩ ආනයනය කිරීමයි.

vii. '**ප්‍රධාන ව්‍යාපෘති**' යන්නෙන් අදහස් කරනුයේ පහත සඳහන් ආකාරවලින් ආර්ථිකයට දායකත්වයක් සපයන ව්‍යාපෘති වේ.

අ) අවමය ඇමෙරිකානු ඩොලර් මිලියන 100ක අපේක්ෂා කරගත් හෝ සාක්ෂාත් කරගත් ආයෝජනයක් හෝ

ආ) රැකියා අවස්ථා 500ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් උත්පාදනය කර, පවත්වාගෙන යනු ලබන හෝ

ඇ) වාර්ෂිකව අවමය ඇමෙරිකානු ඩොලර් මිලියන 50ක විදේශ විනිමය ඉපැයීම් සිදු කරන හෝ

ඈ) අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ඇති සෞඛ්‍ය ක්ෂේත්‍රයේ හෝ අමාත්‍ය මණ්ඩලය විසින් හඳුනාගෙන ඇති ඕනෑම ක්ෂේත්‍රයක නිශ්චිත අවශ්‍යතාවන් සපුරාලන, ජාතික වැදගත්කමකින් යුතු ව්‍යාපෘති හෝ

ඉ) 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත සහ ඒ යටතේ පළකරනු ලබන රෙගුලාසි ප්‍රකාරව හඳුනාගත් ව්‍යාපෘති.

viii. '**17 වගන්තිය යටතේ ව්‍යාපෘති**' යනුවෙන් අදහස් වන්නේ, ආයෝජන සීමාව හෝ වෙනත් නිශ්චිත අවශ්‍යතාවක් සපුරාලමින් 1978 අංක 4 දරන ආයෝජන මණ්ඩල පනතේ, 17 වන වගන්තිය යටතේ අනුමත කරන ලද සහ ආයෝජන මණ්ඩලය සමග ගිවිසුමකට එළෙඹෙන ලද ව්‍යවසායකි.

ix. '**දේශීය වෙළෙඳපොල**' යනුවෙන් අදහස් කරන්නේ භාණ්ඩ දේශීය පරිභෝජනයට හෝ භාවිතයට ශ්‍රී ලංකාව තුළවිකිණීම හෝ පෞද්ගලිකව පරිහරණය කිරීමයි.

4. 2020 මැයි මස 22 දිනැති අංක 2176/19 දරන *අතිවිශේෂ ගැසට් පත්‍රයේ* අංක 21 රෙගුලාසියේ '**2020 මැයි මස 22 දින සිට දින 90ක් දක්වා වූ කාලයක් සඳහා තහනම් කරනු ලැබේ**' යන්න වෙනුවට '**2020 මැයි මස 22 දින සිට නැවත දැනුම් දෙනතුරු තහනම් කරනු ලැබේ**' යන්න ආදේශ කරනු ලැබේ.

5. 2020 මැයි මස 22 වැනි දිනැති අංක 2176/19 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද I වන උපලේඛනයෙහි ඇතුළත්ව ඇති පහත සඳහන් සංයෝජිත වර්ගීකරණ සංකේතාංක සහ ඊට අනුරූපී සටහන් මෙයින් ඉවත් කරනු ලැබේ.

| | *I තීරුව ශීර්ෂ අංකය* | *II තීරුව සංයෝජිත වර්ගීකරණ සංකේතය* | | *III තීරුව විස්තරය* | *IV තීරුව තාවකාලික අත්හිටුවීම (TS)* |
|---|---|---|---|---|---|
| **149** | **84.18** | | | **විදුලිමය හෝ නොවන ශීතකරණ, අධි ශීතකරණ සහ වෙනත් ශීතකරණ හෝ අධි ශීතකරණ උපකරණ ; ශීර්ෂ 84.15 යටතේ එන වායු සමීකරණ හැර තාප පොම්ප.** | |
| | | 8418.50.00 | - | ගබඩා කිරීම හා ප්‍රදර්ශනය කිරීම සඳහා වූ, ශීතකරණ හෝ අධි ශීතකරණ උපකරණ අනුබද්ධිත අනෙකුත් ගෘහ භාණ්ඩ (චෙස්ට්, කැබින්, ප්‍රදර්ශන කවුන්ටර, ෂෝකේස් සහ ඒ හා සමාන දෑ) | |
| | | 8418.50.90 | --- | අනෙකුත් | TS |
| | | | - | අනෙකුත් ශීතකරණ හෝ අධි ශීතකරණ උපකරණ | |

උපලේඛනය *(සම්බන්ධිතයි)*

| | *I තීරුව* *ශීර්ෂ අංකය* | *II තීරුව* *සංයෝජිත වර්ගීකරණ සංකේතය* | | *III තීරුව* *විස්තරය* | *IV තීරුව* *තාවකාලික අත්හිටුවීම (TS)* |
|---|---|---|---|---|---|
| | | 8418.69.00 | -- | අනෙකුත් | |
| | | 8418.69.20 | --- | අනෙකුත් ලීටර් 566 ඉක්මවන ලීටර් 850 නොඉක්මවන කැබිනට් හා පෙට්ටි වර්ගයේ ශීතකරණ | TS |
| | | 8418.69.40 | --- | අනෙකුත් කුකුල් මස් කල්තබා ගැනීම සඳහා වූ ක්ෂනික හිමායනක | TS |
| | | 8418.69.60 | --- | අනෙකුත් කිරි ශීත කිරීමේ ටැංකි | TS |
| | | 8418.69.90 | --- | අනෙකුත් | TS |
| | | | - | කොටස් | |
| | | 8418.91.00 | -- | ශීකරණ හෝ අධි ශීතකරණ උපකරණ ලබාගැනීමට නිර්මාණය කළ ගෘහ භාණ්ඩ | |
| | | 8418.91.10 | --- | ශීතකරණ සඳහා කැබිනට් | TS |
| | | 8418.91.20 | --- | අනෙකුත් කැබිනට් | TS |
| | | 8418.91.90 | --- | අනෙකුත් | TS |
| | | 8418.99.00 | -- | අනෙකුත්: | TS |
| | | | | | |
| **150** | **84.50** | | | **සේදීම සහ වේලීම දෙකම කරන යන්ත්‍ර ඇතුළුව, ගෘහස්ථ හෝ ලොන්ඩරි වර්ගයේ රෙදි සෝදන යන්ත්‍ර.** | |
| | | | --- | අනෙකුත් : | |
| | | 8450.20.00 | - | කිලෝ ග්‍රෑම් 10 ට වැඩි වියළි ලිනන් ධාරිතාවයක් සහිත යන්ත්‍ර | TS |
| | | | | | |
| **155** | **87.04** | | | **බඩු ප්‍රවාහනය කිරීම සඳහා වූ මෝටර් වාහන** | |
| | | | - | විශේෂ කාර්යය ටැන්කර/ බවුසර සහ ට්‍රක් රථ: | |
| | | 8704.21.11 | ---- | කිරි ප්‍රවාහනය සඳහා වූ මළ නොබැඳෙන වානේ ටැංකි සහිත, ටැන්කර සහ බවුසර, අවුරුදු පහකට වඩා නොපැරණි | TS |
| | | 8704.22.00 | -- | දළ වාහන බර ටොන් 5 ඉක්මවූ එහෙත් ටොන් 20 නොඉක්මවූ: | |
| | | | --- | කිරි ප්‍රවාහනය සඳහා වූ මළ නොබැඳෙන වානේ ටැංකි සහිත ටැන්කර සහ බවුසර, ශීතාගාරික ට්‍රක් රථ | |
| | | 8704.22.41 | ---- | අවුරුදු පහකට වඩා නොපැරණි | TS |
| | | 8704.22.42 | ---- | අවුරුදු පහකට වඩා පැරණි නමුත් වසර දහයකට වඩා නොපැරණි | TS |
| | | 8704.23.00 | -- | දළ වාහන බර ටොන් 20 ඉක්මවූ : | |
| | | | --- | කිරි ප්‍රවාහනය සඳහා වූ මළ නොබැඳෙන වානේ ටැංකි සහිත ටැන්කර සහ බවුසර, ශීතාගාරික ට්‍රක් රථ, | |
| | | 8704.23.51 | ---- | අවුරුදු පහකට වඩා නොපැරණි | TS |
| | | 8704.23.52 | ---- | අවුරුදු පහකට වඩා පැරණි නමුත් වසර දහයකට වඩා නොපැරණි | TS |
| | | 8704.31.00 | -- | දළ වාහන බර ටොන් 5 නොඉක්මවූ : | |
| | | | --- | විශේෂ අරමුණු සඳහා ටැංකි, බවුසර සහ ට්‍රක් රථ | |

*උපලේඛනය (සම්බන්ධිතයි)*

| | *I තීරුව ශීර්ෂ අංකය* | *II තීරුව සංයෝජිත වර්ගීකරණ සංකේතය* | | *III තීරුව විස්තරය* | *IV තීරුව තාවකාලික අත්හිටුවීම (TS)* |
|---|---|---|---|---|---|
| | | 8704.31.11 | ---- | කිරි ප්‍රවාහනය සඳහා වූ මළ නොබැඳෙන වානේ ටැංකි සහිත, ටැන්කර සහ බවුසරඃ අවුරුදු පහකට වඩා නොපැරණි | TS |
| | | 8704.32.00 | -- | දළ වාහන බර ටොන් 5 ඉක්මවූ : | |
| | | | --- | කිරි ප්‍රවාහනය සඳහා වූ මළ නොබැඳෙන වානේ ටැංකි සහිත ටැන්කර සහ බවුසර සහ ශීතාගාරික ට්‍රක් රථඃ | |
| | | 8704.32.41 | ---- | අවුරුදු පහකට වඩා නොපැරණි | TS |
| | | 8704.32.42 | ---- | අවුරුදු පහකට වඩා පැරණි නමුත් අවුරුදු දහය නොඉක්මවන | TS |

6. 2020 මැයි මස 22 වැනි දිනැති අංක 2176/19 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළකරන ලද I වන උපලේඛනයෙහි, සංයෝජිත වර්ගීකරණ සංකේතාංක 1903.00.00සහ ඊට අනුරූපී සටහන් ඉවත්කර මෙහි පහත සඳහන් අයිතම එම ගැසට් පත්‍රයේ I උපලේඛනයට ඇතුළත් කරනු ලැබේ.

| | *I වැනි තීරුව ශීර්ෂ අංකය* | *II වැනි තීරුව සංයෝජිත වර්ගීකරණ සංකේතය* | | *III වැනි තීරුව විස්තරය* | *IV වැනි තීරුව තාවකාලික අත්හිටුවීම (TS)* |
|---|---|---|---|---|---|
| **171** | **19.03** | | | පෙති, කැට, මුතු වැනි වූ, බීජ වැනි වූ හෝ ඒ හා සමාන ආකාරයේ වූ, පිෂ්ටය අඩංගුකර තැනූ ටැපියෝකා (මඤ්ඤොක්කා පිටි) පිටි සහ එහි ආදේශකයන්. (සව් හැර අනෙකුත්) | TS |
| | | | | | |
| **172** | **21.06** | | | ආහාර සැකසුම්, අන්තැනක ඇතුළත් නොවූ හෝ අන්තර්ගත නොවූ | |
| | | 2106.90.00 | **-** | අනෙකුත් : | |
| | | 2106.90.60 | **---** | පපඩම් හා ඒ ආශ්‍රිත නිෂ්පාදන | TS |
| | | | | | |
| **173** | **22.06** | | | පැසවූ හෝ අනෙකුත් පාන වර්ග (උදාහරණ වශයෙන් සයිඩර්, පෙරී, මීඩ සකේ); පැසවූ පාන වර්ගවල මිශ්‍රනයන් සහ අන්තැනක නිශ්චිත ලෙස සඳහන් නොවූ හෝ ඇතුළත් නොකළ, අමද්‍යප පාන වර්ග සහ පැස වූ පාන වර්ගවල මිශ්‍රනයන්. | |
| | | 2206.00.91 | **----** | තාල් රා | TS |
| | | 2206.00.99 | **----** | අනෙකුත් | TS |
| | | | | | |
| **174** | **84.15** | | | ආර්ද්‍රතාව වෙන් වශයෙන් පාලනය කළ නොහැකි යන්ත්‍ර ඇතුළුව, මෝටරයෙන් ක්‍රියාකරවනු ලබන හුලංපෙත්තකින් හා වායු උෂ්ණත්වය හා ආර්ද්‍රතාවය වෙනස් කිරීම පිණිස අවශ්‍ය අංගවලින් යුත් වායු සමීකරණ යන්ත්‍ර. | |
| | | 8415.90.00 | - | කොටස් | |

*උපලේඛනය (සම්බන්ධිතයි)*

| | *I වැනි තීරුව ශීර්ෂ අංකය* | *II වැනි තීරුව සංයෝජිත වර්ගීකරණ සංකේතය* | | *III වැනි තීරුව විස්තරය* | *IV වැනි තීරුව තාවකාලික අත්හිටුවීම (TS)* |
|---|---|---|---|---|---|
| | | 8415.90.90 | --- | අනෙකුත් | TS |
| | | | | | |
| **175** | **85.28** | | | **රූපවාහිනී ග්‍රාහක උපකරණ ඒකාබද්ධ නොවූ නිරීක්ෂක සහ ප්‍රොජෙක්ටර් ; ගුවන් විදුලි ප්‍රචාර ග්‍රාහක හෝ ශබ්දය හෝ වීඩියෝ පටිගත කිරීමේ හෝ ප්‍රතිනිෂ්පාදන කිරීමේ උපකරණ ඒකාබද්ධ වූ හෝ නොවූ, රූපවාහිනී ග්‍රාහක උපකරණ.** | |
| | | | - | ගුවන් විදුලි ප්‍රචාර ග්‍රාහක හෝ ශබ්දය හෝ වීඩියෝ පටිගත කිරීමේ හෝ ප්‍රතිනිෂ්පාදන කිරීමේ උපකරණ ඒකාබද්ධ වූ හෝ නොවූ, රූපවාහිනී ග්‍රාහක උපකරණ : | |
| | | 8528.71.00 | -- | වීඩියෝ දර්ශකයක් හෝ තිරයක් ඒකාබද්ධ කිරීමට සැළසුම් නොකළ : | |
| | | 8528.71.20 | --- | අනෙකුත්, වර්ණ | TS |
| | | 8528.71.90 | --- | අනෙකුත් | TS |
| | | 8528.72.00 | -- | අනෙකුත්, වර්ණ : | |
| | | 8528.72.10 | --- | එක්කාසුනොකළ සම්පූර්ණයෙන්ම කොටස්වලට වෙන්කළ | TS |
| | | | --- | අනෙකුත්, කැතෝඩ කිරණ නළ සහිත : | |
| | | 8528.72.31 | ---- | අඟල් 14 ට අඩු තිරයක් සහිත | TS |
| | | 8528.72.32 | ---- | අඟල් 14 ක සහ අඟල් 15 ට නොවැඩි තිරයක් සහිත | TS |
| | | 8528.72.33 | ---- | අඟල් 15 ට වැඩි සහ අඟල් 21 ට නොවැඩි තිරයක් සහිත | TS |
| | | 8528.72.34 | ---- | අඟල් 21 ට වැඩි සහ අඟල් 25 ට නො වැඩි තිරයක් සහිත | TS |
| | | 8528.72.35 | ---- | අඟල් 25 ට වැඩි සහ අඟල් 29 ට නො වැඩි තිරයක් සහිත | TS |
| | | 8528.72.36 | ---- | අඟල් 29 ට වැඩි සහ අඟල් 34 ට නො වැඩි තිරයක් සහිත | TS |
| | | 8528.72.39 | ---- | අනෙකුත් | TS |
| | | | --- | අනෙකුත්, ද්‍රව ස්ඵටික ප්‍රදර්ශක සහිත : | |
| | | 8528.72.41 | ---- | අඟල් 32 ට නොවැඩි තිරයක් සහිත | TS |
| | | 8528.72.49 | ---- | අනෙකුත් | TS |
| | | | ---- | අනෙකුත්: | |
| | | 8528.72.91 | ---- | අඟල් 32 ට නොවැඩි තිරයක් සහිත | TS |
| | | 8528.72.99 | ---- | අනෙකුත් | TS |
| | | 8528.73.00 | -- | අනෙකුත්, කේවල වර්ණ | |
| | | 8528.73.20 | --- | අනෙකුත්, කැතෝඩ කිරණ නළ සහිත හෝ රහිත, සම්පූර්ණයෙන්ම කොටස් වලට වෙන්කළ | TS |
| | | 8528.73.90 | --- | අනෙකුත් | TS |
| | | | | | |

7. 2020 මැයි මස 22 වැනි දිනැති අංක 2176/19 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද II වන උපලේඛනයෙහි ඇතුළත්ව ඇති පහත සඳහන් සංයෝජිත වර්ගීකරණ සංකේතාංක සහ ඊට අනුරූපී සටහන් මෙයින් ඉවත් කරනු ලැබේ.

| | *I වැනි තීරුව ශීර්ෂ අංකය* | *II වැනි තීරුව සංයෝජිත වර්ගීකරණ සංකේතය* | | *III වැනි තීරුව විස්තරය* | *IV වැනි තීරුව ණය පදනම මත (C)* |
|---|---|---|---|---|---|
| **126** | **85.41** | | | ඩයෝඩ, ට්‍රාන්සිස්ටර් සහ සමාන අර්ධ සන්නායක උපක්‍රම; පනේල වශයෙන් සාදන ලද හෝ මොඩියුල වශයෙන් ඒකරාශි කරන ලද හෝ එසේ නොකළ, පොටෝවෝල්ටෙක් කෝෂ ඇතුළුව, ඡායා සංවේදී අර්ධ සන්නායක උපක්‍රම; ආලෝක නිකුත් කරන ඩයෝඩ(එල්ඊඩී); නංවන ලද පිසෝ ඉලෙක්ට්‍රික් ස්ඵටික | |
| | | 8541.10.00 | - | ඡායා සංවේදි ඩයෝඩ හෝ ආලෝකය නිකුත් කරන ඩයෝඩ හැර, ඩයෝඩ (එල්ඊඩී) | C |
| | | | - | ඡායා සංවේදී ට්‍රාන්සිස්ටර් හැර, ට්‍රාන්සිස්ටර් : | |
| | | 8541.21.00 | -- | වොට් 1 කට අඩු උත්සර්ජන වේගයක් සහිත; | C |
| | | 8541.29.00 | -- | අනෙකුත් | C |
| | | 8541.30.00 | - | ඡායා සංවේදී උපක්‍රම හැර, තිරිස්ටර්, ඩයක සහ ත්‍රියාක | C |
| | | 8541.40.00 | - | පනේල වශයෙන් සාදන ලද හෝ මොඩියුල වශයෙන් ඒකරාශි කරන ලද හෝ එසේ නොකළ, පොටෝවෝල්ටේක් කෝෂ ඇතුළුව, ඡායා සංවේදී අර්ධ සන්නායක උපක්‍රම; ආලෝක නිකුත් කරන ඩයෝඩ (එල්ඊඩී) | C |
| | | 8541.50.00 | - | අනෙකුත් අර්ධ සන්නායක උපක්‍රම | C |
| | | 8541.60.00 | - | නිවන ලද පීසෝ - විද්‍යුත් ස්ඵටික | C |
| | | 8541.90.00 | - | කොටස් | C |
| | | | | | |
| **127** | **85.42** | | | විද්‍යුත් අනුකලිත පරිපථ | |
| | | | - | විද්‍යුත් අනුකලිත පරිපථ: | |
| | | 8542.31.00 | -- | ධාරක, පරිවර්තක, තර්ක පරිපථ, වර්ධක, ඔරලෝසු සහ කාල පරිපථ හෝ අනෙකුත් පරිපථ සමග සම්බන්ධ වූ හෝ නොවූ සකසනයන් හා පාලකයන් | C |
| | | 8542.32.00 | -- | ධාරක | C |
| | | 8542.33.00 | -- | වර්ධක | C |
| | | 8542.39.00 | -- | අනෙකුත් | C |
| | | 8542.90.00 | - | කොටස් | C |
| | | | | | |
| **130** | **85.45** | | | කාබන් ඉලෙක්ට්‍රෝඩ, කාබන් ඇතිළි, ලාම්පු කාබන්, බැටරි කාබන්, සහ විද්‍යුත් කාර්යයන් සඳහා භාවිතා කරන වර්ගයේ, ලෝහ සහිත හෝ රහිත, ග්‍රැෆයිට් හෝ අනෙකුත් කාබන් වලින් නිම කළ අනෙකුත් භාණ්ඩ | |
| | | | - | ඉලෙක්ට්‍රෝඩ : | |
| | | 8545.11.00 | -- | උඳුන් සඳහා භාවිතා කරන වර්ගයේ | C |
| | | 8545.19.00 | -- | අනෙකුත් : | |
| | | 8545.19.10 | --- | චාප පහන් කාබන් | C |
| | | 8545.19.90 | --- | අනෙකුත් | C |

උපලේඛනය *(සම්බන්ධිතයි)*

| | *I වැනි තීරුව ශීර්ෂ අංකය* | *II වැනි තීරුව සංයෝජිත වර්ගීකරණ සංකේතය* | | *III වැනි තීරුව විස්තරය* | *IV වැනි තීරුව ණය පදනම මත (C)* |
|---|---|---|---|---|---|
| | | 8545.20.00 | - | ඇතිළි | C |
| | | 8545.90.00 | - | අනෙකුත් | C |

8. 2020 මැයි මස 22 වැනි දිනැති අංක 2176/19 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද I වන උපලේඛනයේ සඳහන් කර ඇති පහතින් දැක්වෙන අයිතමයන් එම උපලේඛනයෙන් ඉවත්කර II උපලේඛනයට ඇතුළත් කරනු ලබන අතර 85.28 සංයෝජිත වර්ගීකරණ ශීර්ෂය යටතේ වන පහතින් සඳහන් කර ඇති අයිතම ද එම *ගැසට් පත්‍රයේ* II උපලේඛනයට ඇතුළත් කරනු ලැබේ.

| | *I වැනි තීරුව ශීර්ෂ අංකය* | *II වැනි තීරුව සංයෝජිත වර්ගීකරණ සංකේතය* | | *III වැනි තීරුව විස්තරය* | *IV වැනි තීරුව ණය පදනම මත (C)* |
|---|---|---|---|---|---|
| **135** | **15.13** | | | **ශුද්ධ කළ හෝ නොකළ, නමුත් රසායනිකව නවීකරණය නොකල, පොල් (කොප්පරා) පාම් ගෙඩි මද හෝ බාබසු තෙල් හා ඒවායින් ඉතිරි වූ කොටස්** | |
| | | | - | පොල් (කොප්පරා) තෙල් හා ඉන් ඉතිරි වූ කොටස් : | |
| | | 1513.11.00 | -- | අශුද්ධ තෙල් : | |
| | | | --- | තොග වශයෙන් : | |
| | | 1513.11.11 | ---- | අදූෂිත පොල් තෙල් | C |
| | | 1513.11.19 | ---- | අනෙකුත් | C |
| | | | --- | අනෙකුත් : | |
| | | 1513.11.21 | ---- | අදූෂිත පොල් තෙල් | C |
| | | 1513.11.29 | ---- | අනෙකුත් | C |
| | | | | | |
| **136** | **63.05** | | | **බඩු අසුරා තැබීම සඳහා පාවිච්චිකරණ වර්ගයකට අයත් ගෝනි සහ මළු.** | |
| | | 6305.10.00 | - | ගෝනි හණ රෙදි වලින් හෝ ශීර්ෂ 53.03ට අයත් අනෙකුත් තද රෙදි කෙඳිවලින් නිම කළ : | |
| | | 6305.10.10 | --- | නොගෙතු හෝ ක්‍රෝෂේ නොගෙතු අනෙකුත් ගෝනි සහ මළු | C |
| | | 6305.10.90 | --- | අනෙකුත් | C |
| | | | | | |
| **137** | **84.50** | | | **සේදීම සහ වේලීම දෙකම කරන යන්ත්‍ර ඇතුළුව, ගෘහස්ථ හෝ ලොන්ඩරි වර්ගයේ රෙදි සෝදන යන්ත්‍ර.** | |
| | | | --- | අනෙකුත් : | |
| | | 8450.90.00 | - | කොටස් | |
| | | 8450.90.10 | --- | අනෙකුත් සංරචක සහිත හෝ රහිත කැබිනට් | C |
| | | 8450.90.90 | --- | අනෙකුත් | C |
| | | | | | |

උපලේඛනය( සම්බන්ධිතයි)

| | I වැනි තීරුව ශීර්ෂ අංකය | II වැනි තීරුව සංයෝජිත වර්ගීකරණ සංකේතය | | III වැනි තීරුව විස්තරය | IV වැනි තීරුව ණය පදනම මත (C) |
|---|---|---|---|---|---|
| **138** | **85.28** | | | **රූපවාහිනී ග්‍රාහක උපකරණ ඒකාබද්ධ නොවූ නිරීක්ෂක සහ ප්‍රොජෙක්ටර් ; ගුවන් විදුලි ප්‍රචාර ග්‍රාහක හෝ ශබ්දය හෝ වීඩියෝ පටිගත කිරීමේ හෝ ප්‍රතිනිෂ්පාදන කිරීමේ උපකරණ ඒකාබද්ධ වූ හෝ නොවූ, රූපවාහිනී ග්‍රාහක උපකරණ.** | |
| | | | - | කැතෝඩ කිරණ නළ නිරීක්ෂක : | |
| | | 8528.42.00 | -- | ශීර්ෂ 84.71 හි ස්වයංක්‍රිය දත්ත සැකසුම් යන්ත්‍රයක් සහිතව සෘජුව සම්බන්ධවීමේ හැකියාවෙන් යුත් සහ භාවිත කිරීම සඳහා සැළසුම් කරන ලද | C |
| | | 8528.49.00 | -- | අනෙකුත් : | |
| | | 8528.49.90 | --- | අනෙකුත් | C |
| | | | - | අනෙකුත් නිරීක්ෂක : | |
| | | 8528.52.00 | -- | ශීර්ෂ 84.71 හි ස්වයංක්‍රිය දත්ත සැකසුම් යන්ත්‍රයක් සහිතව සෘජුව සම්බන්ධවීමේ හැකියාවෙන් යුත් සහ භාවිත කිරීම සඳහා සැළසුම් කරන ලද | C |
| | | 8528.59.00 | -- | අනෙකුත් : | |
| | | 8528.59.90 | --- | අනෙකුත් | C |
| | | | | | |
| **139** | **87.08** | | | **87.01 සිට 87.05 දක්වා ශීර්ෂයන්හි මෝටර් වාහනවල කොටස් සහ උපාංග.** | |
| | | 8708.10.00 | - | අවරෝධක (බම්පර්) සහ ඒවායේ කොටස් | C |
| | | | - | බඳවල (කැබ්ස් ඇතුළුව) අනෙකුත් කොටස් සහ උපාංග : | |
| | | 8708.21.00 | -- | ආරක්ෂක ආසන පටි | C |
| | | 8708.29.00 | -- | අනෙකුත් : | |
| | | 8708.29.90 | --- | අනෙකුත් | C |
| | | 8708.30.00 | - | තිරිංග සහ සර්වෝ - තිරිංග ; ඒවායේ කොටස් | C |
| | | 8708.40.00 | - | ගියර පෙට්ටි සහ ඒවායේ කොටස් | C |
| | | 8708.50.00 | - | ඩිපරන්සලය සහිත, අනෙකුත් සම්ප්‍රේෂණ කොටස් සහිත හෝ රහිත ධාවක- ඇක්සල සහ ධාවක නොවන ඇක්සල ; ඒවායේ කොටස් | C |
| | | 8708.70.00 | - | මාර්ග ස්පර්ශක රෝද සහ ඒවායේ කොටස් සහ උපාංග : | |
| | | 8708.70.20 | --- | අනෙකුත් ටයර් සවිකළ පට්ටම් | C |
| | | 8708.70.90 | --- | අනෙකුත් | C |
| | | 8708.80.00 | - | සස්පෙන්ෂන් පද්ධති සහ ඒවායේ කොටස් (ෂොක්-ඇබ්සෝබර්ස් ඇතුළුව) | C |
| | | | - | අනෙකුත් කොටස් සහ උපාංග : | |
| | | 8708.91.00 | -- | රේඩියේටර් සහ ඒවායේ කොටස් | |

උපලේඛනය (සම්බන්ධිතයි)

| | I වැනි තීරුව ශීර්ෂ අංකය | II වැනි තීරුව සංයෝජිත වර්ගීකරණ සංකේතය | | III වැනි තීරුව විස්තරය | IV වැනි තීරුව ණය පදනම මත (C) |
|---|---|---|---|---|---|
| | | 8708.91.10 | --- | රේඩියේටර් | C |
| | | 8708.91.20 | --- | රේඩියේටර් කෝර් | C |
| | | 8708.91.90 | --- | අනෙකුත් | C |
| | | 8708.92.00 | -- | සයිලන්සර් (මෆලස්) සහ එක්ස්හෝස්ට් පයිප්ප ; ඒවායේ කොටස් | C |
| | | 8708.93.00 | -- | ක්ලච් සහ ඒවායේ කොටස් | C |
| | | 8708.94.00 | -- | සුක්කානම් රෝද, සුක්කානම් කනු සහ සුක්කානම් පෙට්ටි ; ඒවායේ කොටස් | C |
| | | 8708.95.00 | -- | සුලං පිරවීමේ පද්ධතියක් සහිත ආරක්ෂක වායු මළු ; ඒවායේ කොටස් | C |
| | | 8708.99.00 | -- | අනෙකුත් | |
| | | 8708.99.10 | --- | 87.02 සහ 87.04 ශීර්ෂයේ දළ වාහන බර කිලෝ ග්‍රෑම් 3,000 ක් හෝ වැඩි වාහන සඳහා වූ, එන්ජිම් සවි නොකළ නමුත් වැද්දුම් සවිකළ හෝ නොකළ අලුත් චැසි | C |
| | | 8708.99.20 | --- | එන්ජින් සවි නොකළ නමුත්, වැද්දුම් සවිකළ හෝ නොකළ අලුත් චැසි | C |
| | | 8708.99.90 | --- | අනෙකුත් | C |
| | | | | | |
| **140** | **87.14** | | | **87.11 සිට 87.13 දක්වා ශීර්ෂයන්හි වාහනවල කොටස් උපාංග.** | |
| | | 8714.10.00 | - | (මොපෙඩ් ඇතුළුව) යතුරුපැදි වල : | |
| | | 8714.10.90 | -- | අනෙකුත් | C |
| | | 8714.20.00 | - | ආබාධිත පුද්ගලයන් සඳහා වූ රථ වල | C |
| | | | - | අනෙකුත් : | |
| | | 8714.91.00 | -- | සැකිළි සහ පෝර්ක් , සහ ඒවායේ කොටස් : | |
| | | 8714.91.10 | --- | ද්විරෝද පා පැදි සැකිළි | C |
| | | 8714.91.20 | --- | ඉදිරි පෝර්ක් | C |
| | | 8714.91.90 | --- | අනෙකුත් | C |
| | | 8714.92.00 | -- | රෝද පට්ටම් සහ ස්පෝක්: | |
| | | 8714.92.10 | --- | රෝද පට්ටම් | C |
| | | 8714.92.90 | --- | අනෙකුත් | C |
| | | 8714.93.00 | -- | කොස්ටර් තිරිංග යෙදීමේ හබ් සහ හබ් තිරිංග හැර, හබ්, සහ ෆ්‍රී - වීල් දැති රෝද | C |
| | | 8714.94.00 | -- | කොස්ටර් තිරිංග යෙදීමේ හබ් සහ හබ් තිරිංග ඇතුළුව, තිරිංග, සහ ඒවායේ කොටස් | C |
| | | 8714.95.00 | -- | සෑදල | C |
| | | 8714.96.00 | -- | පැඩල් සහ ක්‍රෑන්ක් - ගියර්, සහ ඒවායේ කොටස් | C |

*උපලේඛනය ((සම්බන්ධිතයි)*

| | *I වැනි තීරුව ශීර්ෂ අංකය* | *II වැනි තීරුව සංයෝජිත වර්ගීකරණ සංකේතය* | | *III වැනි තීරුව විස්තරය* | *IV වැනි තීරුව ණය පදනම මත (C)* |
|---|---|---|---|---|---|
| | | 8714.99.00 | -- | අනෙකුත්: | |
| | | 8714.99.10 | --- | මඩ කවර | C |
| | | 8714.99.20 | --- | දම්වැල් රඳවන | C |
| | | 8714.99.30 | --- | ආසන රඳවන | C |
| | | | --- | අනෙකුත් | |
| | | 8714.99.91 | ---- | අළුත් ටයර් සවිකරන ලද පා පැදි රිම් | C |
| | | 8714.99.92 | ---- | ගෙවීගිය සලකුණු පෙන්වන ටයර් සවිකළ යතුරු පැදි රිම් | C |
| | | 8714.99.99 | ---- | අනෙකුත් | C |
| | | | | | |
| **141** | **94.05** | | | **අන් ස්ථානයක නිශ්චිත නොවූ හෝ ඇතුළත නොවූ, ගවේෂණාලෝක සහ ස්ථානීය ඉලක්ක ආලෝක ඇතුළුව, ලාම්පු සහ ආලෝක කරණ සවිකිරීම් සහ ඒවායේ කොටස් ; අන් ස්ථානයක නිශ්චිත නොවූ හෝ ඇතුළත් නොවූ, නිත්‍ය ලෙස සවිකළ ආලෝක ප්‍රභවයක් සහිත, ප්‍රදීපනය කළ ලාංඡන, ප්‍රදීපනය කළ නාම පුවරු සහ එවැනි දේ සහ ඒවායේ කොටස්.** | |
| | | 9405.10.00 | - | ප්‍රසිද්ධ ස්ථාන හෝ ප්‍රධාන මාර්ග ආලෝක කරණය සඳහා භාවිතා කරන වර්ගයේ ඒවා හැර, පොකුරු පහන් සහ අනෙකුත් සීලිම් හෝ බිත්ති විදුලි ආලෝකකරණ සවි කිරීම් : | |
| | | 9405.10.20 | --- | වොල්ට් 20 නොවැඩි සරල ධාරා සූර්ය ලාම්පු | C |
| | | 9405.20.00 | - | මේස, ඩෙස්ක්, ඇඳ පසෙක හෝ බිම සිටුවන විදුලි ලාම්පු: | |
| | | 9405.20.20 | --- | වෝල්ට් 20 නොවැඩි සරල ධාරා සූර්ය ලාම්පු | C |
| | | 9405.40.00 | - | අනෙකුත් විදුලි ලාම්පු සහ ආලෝක කරණ සවිකිරීම්: | |
| | | 9405.40.40 | --- | වෝල්ට් 20 නොවැඩි සරල ධාරා සූර්ය ලාම්ප | C |
| | | 9405.50.00 | - | විද්‍යුත් නොවන ලාම්පු සහ ආලෝක කරණ සවිකිරීම්: | |
| | | 9405.50.20 | --- | හිරු එළිය අල්ලාගන්නා, සම්ප්‍රේෂණය කරන, ගොඩනැගිලි අභ්‍යන්තරයේ ආලෝක විසරණය කරන දිවා ආලෝකකරණ උපකරණ | C |
| | | | | | |

9. 2018 ජුනි මස 18 වැනි දිනැති අංක 2076/4 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය, 2019 ඔක්තෝබර් මස 03 වැනි දිනැති අංක 2143/36 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය, 2019 දෙසැම්බර් මස 06 වැනි දිනැති අංක 2152/63 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය සහ 2020 මැයි මස 22 වැනි දිනැති අංක 2176/19 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් සංශෝධනය කරන ලද 2017 නොවැම්බර් මස 09 වැනි දිනැති අංක 2044/40 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළකරන ලද විශේෂ ආනයන බලපත්‍ර නියෝගයන්හි අංක I දරන උපලේඛනයට මෙහි පහත සඳහන් I වන සහ II වන තීරයේ දැක්වෙන අයිතමවල සංයෝජිත වර්ගීකරණ සංකේතාංක සහ IIIසහ IV වන තීරයේ දැක්වෙන ඊට අනුරූපී සටහන් මෙයින් ඇතුළත් කර සංශෝධනය කරනු ලබන අතර 2019 ඔක්තෝබර්

මස 03 වැනි දිනැති අංක 2143/36 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළකරන ලද විශේෂ ආනයන බලපත්‍ර නියෝගයන්හි IV වන උපලේඛනයේ සහ 2020 මැයි මස 22 වැනි දිනැති අංක 2176/19 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයෙහි දක්වා ඇති පහත සඳහන් සංයෝජිත වර්ගීකරණ සංකේතාංක සහ ඊට අනුරූපී සටහන් මෙයින්ඉවත් කරනු ලැබේ.

| | *I වැනි තීරුව ශීර්ෂ අංකය* | *II වැනි තීරුව සංයෝජිත වර්ගීකරණ සංකේතය* | | *III වැනි තීරුව විස්තරය* | *IV වැනි තීරුව අයි.සී.එල (L)* |
|---|---|---|---|---|---|
| **215** | **10.07** | | | ඉදල් ඉරිඟු ඇට (සෝගම්) | |
| | | 1007.90.00 | - | අනෙකුත් | L |
| | | | | | |
| **216** | **25.01** | 2501.00.00 | | ජලීය ආකාරයේ හෝ එසේ නොවන ආකාරයෙන් වූ හෝ එකතු කරන ලද කැටි නොගැසීම් කාරකයෝ නිදහසේ පාවීම සඳහා වන ද්‍රව්‍යයන් අඩංගු වන්නා වූ, ශුද්ධ සෝඩියම් ක්ලෝරයිඩ් හෝ ලුණු (මේස ලුණු සහ ස්වභාවික තත්ත්වය වෙනස් කළ ලුණු ඇතුළුව); මුහුදු ජලය. | L |
| | | | | | |
| **217** | **63.07** | | | ඇඳුම් මෝස්තර කැලි ඇතුළු අනෙකුත් සැකසූ භාණ්ඩ | |
| | | 6307.90.00 | - | අනෙකුත් (මුහුණු ආවරණ පමණි) | L |
| | | | | | |
| **218** | **84.67** | | | වායුමය,ද්‍රව්‍යමය හෝ ස්වයංයුක්ත විදුලිමය හෝ විදුලිමය නොවන මෝටරයකින් යුත්, අතින් වැඩ කිරීම සඳහා මෙවලම. | |
| | | | **-** | ස්වයංයුක්ත විදුලිමය මෝටරයකින් යුත් ඃ | |
| | | 8467.22.00 | **--** | කියත් | L |
| | | | | | |

10. 2019 දෙසැම්බර් මස 06 වැනි දිනැති අංක 2152/63 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය, 2017 ඔක්තෝබර් මස 02 වැනි දිනැති අංක 2039/04 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය සහ 2016 නොවැම්බර් මස 11 වැනි දිනැති අංක 1992/74 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් සංශෝධිත 2016 පෙබරවාරි මස 11 වැනි දිනැති අංක 1953/28 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද, විශේෂ ආනයන බලපත්‍ර ගාස්තු නියෝගයන් හි සඳහන් අංක I දරන උපලේඛනයට පහත සඳහන් අයිතම සහ ආනයන පාලන බලපත්‍ර ගාස්තු මෙයින් ඇතුලත් කරනු ලැබේ.

| *ශීර්ෂ අංකය* | *අයිතමය* | *ආනයන පාලන බලපත්‍ර ගාස්තු* |
|---|---|---|
| 55 | ජලීය ආකාරයේ හෝ එසේ නොවන ආකාරයෙන් වූ හෝ එකතු කරන ලද කැටි නොගැසීම් කාරකයෝ නිදහසේ පාවීම සඳහා වන ද්‍රව්‍යයන් අඩංගු වන්නා වූ, ශුද්ධ සෝඩියම් ක්ලෝරයිඩ් හෝ ලුණු (මේස ලුණු සහ ස්වභාවික තත්ත්වය වෙනස් කළලුණු ඇතුළුව); මුහුදු ජලය. | මි. ර. ගැ. වටිනාකමින් 0.2% |
| 56 | මුහුණු ආවරණ | මි. ර. ගැ. වටිනාකමින් 0.2% |
| 57 | ඉදල් ඉරිඟු ඇට (සෝගම්) | මි. ර. ගැ. වටිනාකමින් 0.3% |
| 58 | කියත් | මි. ර. ගැ. වටිනාකමින් 0.4% |

11. ආනයන බලපත්‍රයක් මත ආනයනය කළ යුතු බවට ආනයන හා අපනයන පාලන රෙගුලාසි මගින් නියම කර ඇති පහත සඳහන් අයිතම ආනයනය 2020 ජුනි මස 30 දින සිට නැවත දැනුම්දෙන තුරු තහනම් කරනු ලැබේ.

| | I වැනි තීරුව ශීර්ෂ අංකය | II වැනි තීරුව සංයෝජිත වර්ගීකරණ සංකේතය | | III වැනි තීරුව විස්තරය | IV වැනි තීරුව අයි.සී.එල් (L) |
|---|---|---|---|---|---|
| **33** | **84.15** | | | **ආර්ද්‍රතාව වෙන් වශයෙන් පාලනය කළ නොහැකි යන්ත්‍ර ඇතුළුව, මෝටරයෙන් ක්‍රියාකරවනු ලබන හුළංපෙත්තකින් හා වායු උෂ්ණත්වය හා ආර්ද්‍රතාවය වෙනස් කිරීම පිණිස අවශ්‍ය අංග වලින් යුත් වායු සමීකරණ යන්ත්‍ර.** | |
| | | 8415.10.00 | - | ස්වයං යුක්ත හෝ 'දෙපලු පද්ධති', ජනෙල්, බිත්ති, සිවිලිම හෝ බිමකට සවි කිරීමට කරන ලද ආකාරයෙන් වූ : | |
| | | 8415.10.10 | --- | පාවිච්චි කළ/ පිළිසකසන ලද | L |
| | | 8415.20.00 | - | මෝටර් රථවල ගමන් කරන්නන් සඳහා භාවිතා වන වර්ගය : | |
| | | 8415.20.10 | --- | පාවිච්චි කළ/ පිළිසකසන ලද | L |
| | | | - | අනෙකුත් | |
| | | 8415.81.00 | -- | සිසිල් උණුසම් චක්‍රයේ ප්‍රතිවර්ත්‍යතාව සඳහා වූ වැල්වයකින් හා ශීතකරණ ඒකකයකින් යුක්ත (ආපසු හැරවිය හැකි තාප පෙට්ටි) : | |
| | | 8415.81.10 | --- | පාවිච්චි කළ/ පිළිසකසන ලද | L |
| | | 8415.82.00 | --- | අනෙකුත් ශීතකරණ ඒකකයකින් යුක්ත : | |
| | | 8415.82.10 | --- | පාවිච්චි කළ/ පිළිසකසන ලද | L |
| | | 8415.83.00 | -- | ශීතකරණ ඒකකයකින් යුක්ත නොවූ : | |
| | | 8415.83.10 | --- | පාවිච්චි කළ/ පිළිසකසන ලද | L |
| | | 8415.90.00 | - | කොටස් : | |
| | | 8415.90.10 | --- | එළිමහනේ සවිකරන, දෙපළු පද්ධති, වායු සමීකරණ යන්ත්‍ර : | L |
| | | 8415.90.11 | ---- | පාවිච්චි කළ/ පිළිසකසන ලද | L |
| | | 8415.90.19 | ---- | අනෙකුත් | L |
| | | 8415.90.20 | ---- | ගෘහස්ත දෙපළු පද්ධති, වායු සමීකරණ යන්ත්‍ර : | L |
| | | 8415.90.29 | ---- | අනෙකුත් | L |
| | | | | | |
| **34** | **84.18** | | | **විදුලිමය හෝ නොවන ශීතකරණ, අධි ශීතකරණ සහ වෙනත් ශීතකරණ හෝ අධි ශීතකරණ උපකරණ ; ශීර්ෂ 84.15 යටතේ එන වායුසමීකරණ හැර තාප පොම්ප.** | |
| | | 8418.10.00 | - | වෙන් වූ බාහිර දොරවල් සමග වූ සංයුක්ත ශීතකරණ-අධි ශීතකරණ : | |
| | | 8418.10.10 | --- | පාවිච්චි කළ/ පිළිසකසන ලද | L |
| | | 8418.21.00 | -- | සම්පීඩන වර්ගය : | |
| | | 8418.21.10 | --- | පාවිච්චි කළ/ පිළිසකසන ලද | L |

උපලේඛනය (සම්බන්ධිතයි)

| | I වැනි තීරුව ශීර්ෂ අංකය | II වැනි තීරුව සංයෝජිත වර්ගීකරණ සංකේතය | | III වැනි තීරුව විස්තරය | IV වැනි තීරුව අයි.සී.එල් (L) |
|---|---|---|---|---|---|
| | | 8418.29.00 | -- | අනෙකුත් | |
| | | 8418.29.10 | --- | පාවිච්චි කළ/ පිළිසකසන ලද අවශෝෂක වර්ගය, විදුලිමය | L |
| | | 8418.29.30 | --- | පාවිච්චි කළ/ පිළිසකසන ලද | L |
| | | 8418.30.00 | - | ධාරිතාව ලීටර් 800 ට වැඩි නොවූ පෙට්ටි වර්ගයේ අධි ශීතකරණ : | |
| | | 8418.30.10 | --- | ලීටර් 566 ට වැඩි නොවූ පාවිච්චි කළ/ පිළිසකසන ලද | L |
| | | 8418.30.30 | --- | පාවිච්චි කළ/ පිළිසකසන ලද, අනෙකුත් | L |
| | | 8418.40.00 | - | ධාරිතාව ලීටර් 900 ට වැඩි නොවූ සිරස් වර්ගයේ අධි ශීතකරණ : | |
| | | 8418.40.10 | --- | ලීටර් 566 ට වැඩි නොවූ පාවිච්චි කළ/ පිළිසකසන ලද | L |
| | | 8418.40.30 | --- | පාවිච්චි කළ/ පිළිසකසන ලද, අනෙකුත් | L |
| | | 8418.50.00 | - | ගබඩා කිරීම සහ ප්‍රදර්ශණය කිරීම සඳහා වූ, ශීතකරණ හෝ අධි ශීතකරණ උපකරණ අනුබද්ධ අනෙකුත් ගෘහ භාණ්ඩ (චෙස්ට්, කැබිනට්, ප්‍රදර්ශණ කවුන්ටර, ෂෝකේස් සහ ඒ හා සමාන දේ) : | |
| | | 8418.50.10 | --- | පාවිච්චි කළ/ පිළිසකසන ලද | L |
| | | | - | අනෙකුත් ශීතකරණ හෝ අධි ශීතකරණ උපකරණ ; තාප පොම්ප : | |
| | | 8418.61.00 | -- | ශීර්ෂ 84.15 යටතේ එන වායුසමීකරණ යන්ත්‍ර හැර තාප පොම්ප : | L |
| | | 8418.69.00 | -- | අනෙකුත් : | |
| | | 8418.69.10 | --- | පාවිච්චි කළ/ පිළිසකසන ලද, ලීටර් 566 ඉක්මවන ලීටර් 850 නොඉක්මවන කැබිනට් හා පෙට්ටි වර්ගයේ ශීතකරණ | L |
| | | 8418.69.30 | --- | පාවිච්චි කළ/ පිළිසකසන ලද, කුකුල් මස් කල් තබා ගැනීම සඳහා වූ ක්ෂණික හිමායනක | L |
| | | 8418.69.50 | --- | පාවිච්චි කළ/ පිළිසකසන ලද කිරි ශීත කිරීමේ ටැංකි | L |
| | | 8418.69.70 | --- | පාවිච්චි කළ/ පිළිසකසන ලද, අනෙකුත් | L |
| | | | | | |
| **35** | **84.50** | | | **සේදීම සහ වේලීම දෙකම කරන යන්ත්‍ර ඇතුළුව, ගෘහස්ථ හෝ ලොන්ඩරි වර්ගයේ රෙදි සෝදන යන්ත්‍ර.** | |
| | | 8450.11.00 | -- | සම්පූර්ණයෙන්ම ස්වයංක්‍රීය යන්ත්‍ර : | |
| | | 8450.11.20 | --- | පාවිච්චි කළ/ පිළිසකසන ලද | L |
| | | | --- | අනෙකුත්, මුදුනින් පුරවන : | |
| | | 8450.12.00 | -- | ඇතුළත සවි කළ කේන්ද්‍රාපසාරී වියළනයක් සහිත, අනෙකුත් යන්ත්‍ර : | |

| | *I වැනි තීරුව ශීර්ෂ අංකය* | *II වැනි තීරුව සංයෝජිත වර්ගීකරණ සංකේතය* | | *III වැනි තීරුව විස්තරය* | *IV වැනි තීරුව අයි.සී.එල් (L)* |
|---|---|---|---|---|---|
| | | 8450.12.20 | --- | පාවිච්චි කළ/ පිළිසකසන ලද | L |
| | | 8450.19.00 | -- | අනෙකුත් : | |
| | | 8450.19.20 | --- | පාවිච්චි කළ/ පිළිසකසන ලද | L |
| | | | | | |

12. 2020 මැයි මස 22 වැනි දිනැති අංක 2176/19 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ අංක 21 රෙගුලාසිය යටතේ පළකරන ලද උපලේඛනයෙන්, මෙහි පහත සඳහන් I වන හා II වන තීරයේ දැක්වෙන අයිතමවල සංයෝජිත වර්ගීකරණ සංකේතාංක සහ III වන හා IV වන තීරයේ දැක්වෙන, ඊට අනුරූපී සටහන් මෙයින් ඉවත් කරනු ලැබේ.

| | *I වැනි තීරුව ශීර්ෂ අංකය* | *II වැනි තීරුව සංයෝජිත වර්ගීකරණ සංකේතය* | | *III වැනි තීරුව විස්තරය* | *IV වැනි තීරුව අයි.සී.එල් (L)* |
|---|---|---|---|---|---|
| **8** | **09.10** | | | **ඉඟුරු, කුංකුම (සැප්රන්), කහ(කුර්කුමා), තයිම්, බේකොල** | |
| | | | - | ඉඟුරු | |
| | | 0910.11.00 | -- | කුඩුකල හෝ ඇඹරූ | |
| | | 0910.11.10 | --- | වියළි | L |
| | | | | | |

13. 2018 ජූනි මස 18 වැනි දිනැති අංක 2076/4 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය, 2019 ඔක්තෝබර් මස 03 වැනි දිනැති අංක 2143/36 දරන *අතිවිශේෂ ගැසට් පත්‍රය*, 2019 දෙසැම්බර් මස 06 වැනි දිනැති අංක 2152/63 දරන *අතිවිශේෂ ගැසට් පත්‍රය* සහ 2020 මැයි මස 22 වැනි දිනැති අංක 2176/19 දරන *අතිවිශේෂ ගැසට් පත්‍රය* මගින් සංශෝධනය කරන ලද 2017 නොවැම්බර් මස 09 වැනි දිනැති අංක 2044/40 දරන *අතිවිශේෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද විශේෂ ආනයන බලපත්‍ර නියෝගයන්හි අංක I දරන උපලේඛනයේ මෙහි පහත සඳහන් I වන සහ II වන තීරයේ දැක්වෙන අයිතමවල සංයෝජිත වර්ගීකරණ සංකේතාංක සහ III සහ IV වන තීරයේ දැක්වෙන ඊට අනුරූපී සටහන් මෙයින් ඉවත් කෙරේ.

| | *I වැනි තීරුව ශීර්ෂ අංකය* | *II වැනි තීරුව සංයෝජිත වර්ගීකරණ සංකේතය* | | *III වැනි තීරුව විස්තරය* | *IV වැනි තීරුව අයි.සී.එල් (L)* |
|---|---|---|---|---|---|
| **41** | **25.24** | | | ඇස්බෙස්ටෝස් | |
| | | 2524.10.00 | - | ක්‍රොසිඩොලයිට් | L |
| | | 2524.90.00 | - | අනෙකුත් | L |
| | | | | | |
| **71** | **29.03** | | | හයිඩ්‍රොකාබන් වර්ගවල හැලජනීය ව්‍යුත්පන්නයන්. | |
| | | | - | චක්‍රීය නොවන හයිඩ්‍රෝකාබන් වල ප්ලෝරිනේටඩ්, බ්‍රොමිනේටඩ් හෝ අයඩිනේටඩ් ව්‍යුත්පන්න : | |
| | | 2903.39.00 | -- | අනෙකුත් | L |

උපලේඛනය *(සම්බන්ධිතයි)*

| | *I වැනි තීරුව ශීර්ෂ අංකය* | *II වැනි තීරුව සංයෝජිත වර්ගීකරණ සංකේතය* | | *III වැනි තීරුව විස්තරය* | *IV වැනි තීරුව අයි.සී.එල් (L)* |
|---|---|---|---|---|---|
| | | | --- | චක්‍රීය නොවන හයිඩ්‍රෝකාබන් වල සංතෘප්ත ක්ලොරිනිකෘත ව්‍යුත්පන්න : | |
| | | 2903.39.11 | ---- | ට්‍රයිෆ්ලෝරෝමීතේන් (එච්එෆ්සී-23) | L |
| | | 2903.39.13 | ---- | ෆ්ලෝරෝමීතේන් (එච්එෆ්සී-41)<br>1,2-ඩයිෆ්ලෝරෝඊතේන් (එච්එෆ්සී-152) සහ<br>1,1-ඩයිෆ්ලෝරෝඊතේන් (එච්එෆ්සී-152ඒ) | L |
| | | | --- | චක්‍රීය නොවන හයිඩ්‍රෝකාබන්වල ෆ්ලෝරිනේටඩ්, බ්‍රොමිනේටඩ් හෝ අයඩිනේටඩ් ව්‍යුත්පන්න : | |
| | | 2903.39.31 | ---- | මීතයිල් බ්‍රෝමයිඩ් (බ්‍රෝමෝමීතේන්) | L |
| | | | | | |
| | **38.08** | | | **සිල්ලරට විකුණන ස්වරූපයෙන් සකස් කළ හෝ දැවටුම් වල බහාලූ සකස් කිරීම් හෝ නිම කළ භාණ්ඩයන් වශයෙන් සකස් කළ (උදාහරණ වශයෙන්, ගෙන්දගම් යොදා සකස් කළ පටි, පහන් වැටි සහ ඉටිපන්දම්, මැසි කඩදාසි වැනි) කෘමිනාශක, මූෂික නාශක, දිලීර නාශක, වල් පැළෑටි නාශක, පැතිරීම වළකන නිෂ්පාදන, පැළෑටි වැඩීම නියාමනකාරක, විෂබීජ මර්ධක සහ ඒ හා සමාන නිෂ්පාදන.** | |
| | | 3808.93.00 | -- | වල් පැළෑටි නාශක, අංකුර නාශක නිෂ්පාදන සහ පැළෑටි වැඩීම පාලනය දරන ද්‍රව්‍ය : | |
| | | 3808.93.90 | --- | ග්ලයිපොසේට් | L |
| | | | | | |
| **109** | **38.24** | | | **වාත්තු අච්චු හෝ මධ්‍ය කුහර සඳහා වූ සකස් කළ බැඳුම් වර්ග ; අන්තැනක නිශ්චිතව සඳහන් කොට හෝ ඇතුළත් කොට නොමැති (ස්වභාවික නිෂ්පාදනයන්ගේ මිශ්‍රණ වර්ගද ඇතුළුව) රසායනික හෝ ආශ්‍රිත කර්මාන්තයන්ගේ රසායනික නිෂ්පාදන සහ සකස් කිරීම්.** | |
| | | 3824.78.00 | -- | පර්ෆ්ලුකාබන (පීඑෆ්සී වර්ග) හෝ හයිඩ්රොෆ්ලොලුකාබන (එච්එෆ්සී වර්ග) අඩංගු, එහෙත් ක්ලෝරොෆ්ලුරොකාබන (සීඑෆ්සී වර්ග) හෝ හයිඩ්රොක්ලෝරොෆ්ලුරොකාබන (එච්එෆ්සී වර්ග) අඩංගු නොවන | |
| | | | --- | පර්ෆ්ලුකාබන (පීඑෆ්සීවර්ග) හෝ හයිඩ්‍රොෆ්ලුරොෆ්ලෝරෝකාබන් (එච්එෆ්සී වර්ග) අඩංගු, එහෙත් ක්ලෝරොෆ්ලෝරෝකාබන් (සීඑෆ්සී වර්ග) හෝ හයිඩ්‍රොක්ලෝරෝෆ්ලුරොකාබන (එච්එෆ්සී වර්ග) අඩංගු නොවන. | |
| | | 3824.78.11 | ---- | ට්‍රයිෆ්ලෝරෝමීතේන් (එච්එෆ්සී-23) අන්තර්ගත වූ | L |

උපලේඛනය *(සම්බන්ධිතයි)*

| | *I වැනි තීරුව ශීර්ෂ අංකය* | *II වැනි තීරුව සංයෝජිත වර්ගීකරණ සංකේතය* | | *III වැනි තීරුව විස්තරය* | *IV වැනි තීරුව අයි.සී.එල් (L)* |
|---|---|---|---|---|---|
| | | | --- | පර්ෆ්ලුරොකාබන (පීඑෆ්සී වර්ග) හෝ හයිඩ්රොෆ්ලුරෝකාබන (එච්එෆ්සී වර්ග) අඩංගු එහෙත් ක්ලෝරෝෆ්ලුරෝකාබන (සීඑෆ්සී වර්ග) හෝ හයිඩ්රෝක්ලෝරොෆ්ලුරොකාබන් (එච්සීඑෆ්සී වර්ග) | |
| | | 3824.78.23 | ---- | අනෙකුත්, ඉහත උපශීර්ෂවල නොමැති, පෙන්ටාෆ්ලෝරොඊතේන් (එච්එෆ්සී - 125) ස්කන්ධයෙන් 40% ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් අඩංගු | L |
| | | | | | |

14. 2018 ජූනි මස 18 වැනි දිනැති අංක 2076/4 දරන *අතිවිශේෂ ගැසට් පත්‍රය*, 2019 ඔක්තෝබර් මස 03 වැනි දිනැති අංක 2143/36 දරන *අතිවිශේෂ ගැසට් පත්‍රය*, 2019 දෙසැම්බර් මස 06 වැනි දිනැති අංක 2152/63 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය සහ 2020 මැයි මස 22 වැනි දිනැති අංක 2176/19 දරන *අතිවිශේෂ ගැසට් පත්‍රය* මගින් සංශෝධනය කරන ලද 2017 නොවැම්බර් මස 09 වැනි දිනැති අංක 2044/40 දරන *අතිවිශේෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද විශේෂ ආනයන බලපත්‍ර නියෝගයන්හි අංක I දරන උපලේඛනයට මෙහි පහත සඳහන් I වන සහ II වන තීරයේ දැක්වෙන අයිතමවල සංයෝජිත වර්ගීකරණ සංකේතාංක සහ III සහ IV වන තීරයේ දැක්වෙන ඊට අනුරූපී සටහන් මෙයින් ඇතුළත් කෙරේ.

| | *I වැනි තීරුව ශීර්ෂ අංකය* | *II වැනි තීරුව සංයෝජිත වර්ගීකරණ සංකේතය* | | *III වැනි තීරුව විස්තරය* | *IV වැනි තීරුව අයි.සී.එල් (L)* |
|---|---|---|---|---|---|
| **219** | **25.24** | | | ඇස්බෙස්ටෝස් | |
| | | 2524.90.20 | --- | ක්‍රිසෝටයිල් | L |
| | | 2524.90.90 | --- | අනෙකුත් | L |
| | | | | | |
| **220** | **29.03** | | | හයිඩ්‍රොකාබන් වර්ගවල හැලජනීය ව්‍යුත්පන්නයන්. | |
| | | 2903.39.00 | -- | අනෙකුත් : | |
| | | | --- | මීතේන්වල සංතෘප්ත ෆ්ලෝරිනීකෘත ව්‍යුත්පන්නයන්: | |
| | | 2903.39.11 | ---- | ෆ්ලූරොමීතේන් (එච්එෆ්සී -41) | L |
| | | 2903.39.13 | ---- | ට්‍රයිෆ්ලෝරෝමීතීන් (එච්එෆ්සී -23) | L |
| | | | --- | ඊතන්වල සංතෘප්ත ෆ්ලෝරිනීකෘත ව්‍යුත්පන්නයන්: | |
| | | 2903.39.21 | ---- | ෆ්ලෝරෝඑතේන් (එච්එෆ්සී -161) | L |
| | | 2903.39.22 | ---- | 1,1- ඩිෆ්ලුරෝඑතේන් (එච්එෆ්සී -152ඒ) | L |
| | | 2903.39.23 | ---- | 1,2- ඩිෆ්ලුරෝඑතේන් (එච්එෆ්සී -152) | L |
| | | 2903.39.24 | ---- | 1,1,1- ට්‍රයිෆ්ලූරෝඑතේන් (එච්එෆ්සී -143ඒ) | L |
| | | 2903.39.25 | ---- | 1,1,2- ට්‍රයිෆ්ලූරෝඑතේන් (එච්එෆ්සී -143) | L |
| | | 2903.39.26 | ---- | 1,1,1,2-ටෙට්‍රාෆ්ලූරෝඑතේන් (එච්එෆ්සී -134ඒ) | L |
| | | 2903.39.27 | ---- | 1,1,2,2- ටෙට්‍රාෆ්ලූරෝඑතේන් (එච්එෆ්සී -134) | L |

*උපලේඛනය (සම්බන්ධිතයි)*

| | *I වැනි තීරුව ශීර්ෂ අංකය* | *II වැනි තීරුව සංයෝජිත වර්ගීකරණ සංකේතය* | | *III වැනි තීරුව විස්තරය* | *IV වැනි තීරුව අයි.සී.එල් (L)* |
|---|---|---|---|---|---|
| | | 2903.39.28 | ---- | පෙන්ටැෆ්ලුරෝඑතේන් (එච්එෆ්සී -125) | L |
| | | | --- | ප්‍රොපේන්වල සංතෘප්ත ෆ්ලෝරිනීකෘත ව්‍යුත්පන්නයන්: | |
| | | 2903.39.31 | ---- | 1,1,1,3,3- පෙන්ටැෆ්ලූරෝප්‍රොපේන් (එච්එෆ්සී -245එෆ්ඒ) | L |
| | | 2903.39.32 | ---- | 1,1,2,2,3- පෙන්ටැෆ්ලූරෝප්‍රොපේන් (එච්එෆ්සී -245සීඒ) | L |
| | | 2903.39.33 | ---- | 1,1,1,3,3,3- හෙක්ෂාෆ්ලූරෝප්‍රොපේන් (එච්එෆ්සී -236එෆ්ඒ) | L |
| | | 2903.39.34 | ---- | 1,1,1,2,3,3- හෙක්ෂාෆ්ලූරෝප්‍රොපේන් (එච්එෆ්සී -236ඊඒ) | L |
| | | 2903.39.35 | ---- | 1,1,1,2,2,3- හෙක්ෂාෆ්ලූරෝප්‍රොපේන් (එච්එෆ්සී -236සීබී) | L |
| | | 2903.39.36 | ---- | 1,1,1,2,3,3- හෙක්ෂාෆ්ලූරෝප්‍රොපේන් (එච්එෆ්සී -227ඊඒ) | L |
| | | | --- | අනෙකුත් ඇසික්ලික් හයිඩ්‍රොකාබනවල සංතෘප්ත ෆ්ලෝරිනීකෘත ව්‍යුත්පන්නයන්: | |
| | | 2903.39.41 | ---- | 1,1,1,3,3- පෙන්ටැෆ්ලූරෝබියුතේන් (එච්එෆ්සී -365එම්එෆ්සී) | L |
| | | 2903.39.42 | ---- | 1,1,1,2,2,3,4,5,5,5- ඩෙකාෆ්ලූරෝපෙන්තේන් (එච්එෆ්සී -43-10එම්ඊඊ) | L |
| | | | | | |
| **221** | **38.08** | | | **සිල්ලරට විකුණන ස්වරූපයෙන් සකස් කළ හෝ දැවටුම් වල බහාලූ සකස් කිරීම් හෝ නිම කළ භාණ්ඩයන් වශයෙන් සකස් කළ (උදාහරණ වශයෙන්, ගෙන්දගම් යොදා සකස් කළ පටි, පහන් වැටි සහ ඉටිපන්දම්, මැසි කඩදාසි වැනි) කෘමිනාශක, මූෂික නාශක, දිලීර නාශක, වල් පැළෑටි නාශක, පැතිරීම වළකන නිෂ්පාදන, පැළෑටි වැඩීම නියාමනකාරක, විෂබීජ මර්ධක සහ ඒ හා සමාන නිෂ්පාදන.** | |
| | | 3808.93.00 | -- | වල් නාශක, පැළ-විරෝධී නිෂ්පාදන සහ ශාක වර්ධන නියාමකයින්: | |
| | | 3808.93.20 | --- | (එන්-ෆොස්ෆොනොමතිල්) ග්ලයිසීන් සහ එහි ලවණ හා ව්‍යුත්පන්නයන් (ග්ලයිෆොසේට්) | L |
| | | 3808.93.90 | --- | අනෙකුත් | L |
| | | | | | |
| **222** | **38.24** | | | **වෙනත් තැනක නිශ්චිතව දක්වා නොමැති හෝ ඇතුළත් කර නොමැති, අත්තිවාරම් අච්චු හෝ හරය සඳහා සකස් කළ බන්ධන; රසායනික නිෂ්පාදන සහ රසායනික හෝ ආශ්‍රිත කර්මාන්ත (ස්වාභාවික නිෂ්පාදනවල මිශ්‍රණයන්ගෙන් සමන්විත).** | |
| | | 3824.78.00 | -- | පර්ෆ්ලුරෝකාබන (පීඑෆ්සී වර්ග) හෝ හයිඩ්‍රෝෆ්ලුරෝකාබන (එච්එෆ්සී වර්ග) අඩංගු එහෙත් ක්ලෝරෝෆ්ලුරෝකාබන (සීඑෆ්සී වර්ග) හෝ හයිඩ්රොක්ලෝරෝෆ්ලුරෝකාබන් (එච්සීඑෆ් වර්ග) | |
| | | | --- | පෙන්ටාෆ්ලෝරොඊතේන් මිශ්‍රණ අඩංගු (R-125), 1,1,1,2- ටෙට්‍රාෆ්ලෝරොඊතේන් (R-134a) සහ 1,1,1-ට්‍රයිෆ්ලෝරොඊතේන් (R-143a): | |

*උපලේඛනය (සම්බන්ධිතයි)*

| | *I වැනි තීරුව ශීර්ෂ අංකය* | *II වැනි තීරුව සංයෝජිත වර්ගීකරණ සංකේතය* | | *III වැනි තීරුව විස්තරය* | *IV වැනි තීරුව අයි.සී.එල් (L)* |
|---|---|---|---|---|---|
| | | 3824.78.11 | ---- | R-404A (R-125 44%, R- 134a 4% සහ R143a 52%) | L |
| | | | --- | ඩයිෆ්ලෝරොමීතේන් මිශ්‍රණ අඩංගු (R-32), පෙන්ටාෆ්ලෝරොඊතේන් (R-125) සහ 1,1,1,2- ටෙට්‍රාෆ්ලෝරොඊතේන් (R-134a) | |
| | | 3824.78.21 | ---- | R-407A (R-32 20%, R-125 40% සහ R-134a 40%) | L |
| | | 3824.78.22 | ---- | R-407B (R-32 10%, R-125 70% සහ R-134a) | L |
| | | 3824.78.23 | ---- | R-407C (R-32 23%, R-125 25% සහ R-134a 52%) | L |
| | | | --- | ඩයිෆ්ලෝරොමීතේන් මිශ්‍රණ අඩංගු (R-32) සහ පෙන්ටාෆ්ලෝරොඊතේන් (R-125) | |
| | | 3824.78.31 | ---- | R-410A (R-32 50% සහ R-125 50% ) | L |
| | | | --- | පෙන්ටාෆ්ලෝරොඊතේන් මිශ්‍රණ අඩංගු (R-125) සහ 1,1,1,- ට්‍රයිෆ්ලෝරොඊතේන් (R-143a): | |
| | | 3824.78.41 | ---- | R-507A(R-125 50% සහ R-143a 50%) | L |
| | | | --- | ට්‍රයිෆ්ලෝරොමීතේන් මිශ්‍රණ අඩංගු (R-23) සහ හෙක්සාෆ්ලුරොඊතේන් (R-116): | |
| | | 3824.78.51 | ---- | R-508A (R-23 39% R-116 61% ) | L |
| | | 3824.78.52 | ---- | R-508B (R-23 46% සහ R-116 54% ) | L |
| | | | | | |

15. 2018 ජූනි මස 18 වැනි දිනැති අංක 2076/4 දරන *අතිවිශේෂ ගැසට් පත්‍රය*, 2019 ඔක්තෝබර් මස 03 වැනි දිනැති අංක 2143/36 දරන *අතිවිශේෂ ගැසට් පත්‍රය*, 2019 දෙසැම්බර් මස 06 වැනි දිනැති අංක 2152/63 දරන *අතිවිශේෂ ගැසට් පත්‍රය* සහ 2020 මැයි මස 22 වැනි දිනැති අංක 2176/19 දරන *අතිවිශේෂ ගැසට් පත්‍රය* මගින් සංශෝධනය කරන ලද 2017 නොවැම්බර් මස 09 වැනි දිනැති අංක 2044/40 දරන *අතිවිශේෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද විශේෂ ආනයන බලපත්‍ර නියෝගයන්හි අංක IV දරන උපලේඛනයට මෙහි පහත සඳහන් I වන සහ II වන තීරයේ දැක්වෙන අයිතමවල සංයෝජිත වර්ගීකරණ සංකේතාංක සහ III සහ IV වන තීරයේ දැක්වෙන ඊට අනුරූපී සටහන් මෙයින් ඇතුළත් කරනු ලැබේ.

| | *I වැනි තීරුව ශීර්ෂ අංකය* | *II වැනි තීරුව සංයෝජිත වර්ගීකරණ සංකේතය* | | *III වැනි තීරුව විස්තරය* | *IV වැනි තීරුව තහනම (B)* |
|---|---|---|---|---|---|
| **9** | **25.24** | | | ඇස්බෙස්ටෝස් | |
| | | 2524.10.00 | - | ක්‍රොසිඩොලයිට් | B |
| | | 2524.90.00 | - | අනෙකුත් ඃ | |
| | | 2524.90.10 | --- | අනෙකුත් ඇම්බිපෝල් | B |
| | | | | | |

07 - 462

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.